# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1907/22 - 2015 මාර්තු මස 25 වැනි බදාදා - 2015.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39 - (1) වගන්තිය යටතේ සංචාරක හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදනු ලබන විධාන.

නවීන් එරන්ජන් දිසානායක,
සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය.

2015 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය නවීන් දිසානායක වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39 (1) වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, 2015 මැයි 15 වන දින නිලවරණ පවත්වා ජාතික සංගම් නිලධාරීන් පත්කර ගන්නා තෙක් පහත උපලේඛනයේ සඳහන් ක්‍රීඩා සංගම්වල නිලධාරීන් ලෙස කටයුතු කරන නිලධාරීන්ට අදාළ සංගමයේ ඉදිරි වැඩකටයුතු අඛන්ඩව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන්ගේ නිල කාලය ඉහත දිනය තෙක් දීර්ඝ කරමි.

1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ පනවන ලද 2013 ජනවාරි මස 15 දිනැති හා අංක 1793/3 දරන රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ක්‍රීඩා සංගම් නියෝග මාලාව ප්‍රකාරව 2015 මාර්තු මස 31 වන දින වන විට නිළ කාලය වසර 2 සම්පූර්ණ කරන සියලු ක්‍රීඩා සංගම් නිලවරණ පැවැත්විය යුතුය.

එහෙත් ජාතික ක්‍රීඩා සංගම් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සහ විරෝධතා පිළිබඳව නීතිපතිතුමාගේ උපදෙස් ලබාගත් අතර ඒ අනුව ඉහත කරුණු පිළිබඳව සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය වන මා වෙත කරන ලද පැමිණිලි වලට අදාළව නීතිපතිතුමාගෙන් නීති උපදෙස් ලබාගත් අතර, එම උපදෙස් වලට අනුව ඊට අදාළ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 13(1) හා 13(2) හි පහත සඳහන් තනතුරු සඳහා ජාතික සංගමයක හෝ සම්මේලනයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, සහකාර ලේකම්, සහකාර භාණ්ඩාගාරික යන ධූර දරා ඇති කෙනෙකු එම තනතුරු සඳහා නැවත පත් වන්නේ නම් යම් තැනැත්තෙකුගේ සමස්ථ සේවා කාල එකතුව අවුරුදු 4 ක් නොඉක්මවිය යුතු බව හා එය අංක 1793/3 දරන ක්‍රීඩා සංගම් නියෝග මාලාව පැනවීමට පෙර හෝ පසුව ධූර දරන ලද සමස්ථ සේවා කාලය වශයෙන් විය යුතුය. එසේ අවුරුදු 4ක සේවා කාලයක් ඉක්මවා ඇති කිසිම තැනැත්තෙකුට එම තනතුරු සඳහා නැවත තේරී පත්විය නොහැකි බව සඳහන් වේ.

උක්ත පැහැදිලි කිරීමට අදාළව 2015 ජාතික ක්‍රීඩා සංගම් නිලවරණයේදී නාම යෝජනා පිළිගැනීම කළ යුතු අතර, පත්වීමට නියමිත තනතුරට අදාළ ඉදිරි වසර 2ක කාලයද ඇතුළත්ව සමස්ථ සේවා කාලය වසර 4 ක් නොඉක්ම වන සියලු තැනැත්තන් හට නාම යෝජනා ඉදිරිපත් කළ හැකි බව කාරුණිකව දැනුම් දෙමි. මවිසින් 2015 නිලවරණය සඳහා 13(2) යටතේ මීට පෙර ලබා දී ඇති අනුමැතීන් මෙයින් අවලංගු කරමි.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඒ අනුව, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා 2013 ජනවාරි මස 15 දිනැති හා අංක 1793/3 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ක්‍රීඩා සංගම් නියෝග මාලාවට අනුකූලව නැවත නාමයෝජනා කැඳවා 2015 මැයි මස 15 වන දිනට ප්‍රථම නිලවරණය පවත්වන මෙන් දන්වමි.

උපලේඛනය

1. බැඩ්මින්ටන්
2. ජල ක්‍රීඩා
3. කායවර්ධන
4. පාපැදි
5. රයිෆල්
6. හොකී
7. රුවල්ඔරු
8. රග්බි පාපන්දු
9. බර ඉසිලීම
10. ජිම්නාස්ටික්
11. ගොල්ෆ්
12. මල්ලවපොර
13. මෝටර්රථ ක්‍රීඩා
14. පැසිපන්දු
15. මලල ක්‍රීඩා
16. ටෙනිස්
17. බ්‍රිජ්
18. කැරම්
19. ජීවිතාරක්ෂක
20. බොක්ෂිං
21. ජූඩෝ
22. බිලියඩ් හා ස්නූකර්
23. වොලිබෝල්
24. එල්ලේ
25. චෙස්
26. ඔරුපැදීම
27. මේසපන්දු
28. ස්කොෂ්
29. ටයිකොන්ඩෝ
30. සැහැල්ලු පන්දු ක්‍රිකට්
31. සවි එසවීම
32. කබඩි
33. ආබාධිතයන්ගේ ක්‍රීඩා
34. මෝටර් සයිකල් ක්‍රීඩා
35. බේස්බෝල්
36. වුෂු
37. ත්‍රෝ බෝල්
38. දුනු විදීම
39. තුරඟ ක්‍රීඩා
40. සම්ප්‍රදායික කරාතේ
41. අත් පන්දු
42. කඹ ඇදීම
43. වෙඩි තැබීම
44. කඩු හරඹ

04 - 312

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.